**පිටබැද්දර ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**--------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජනවාරි 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.17,649,179 ක් වූ බැකෝ ලෝඩරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු අතර, මෝටර් රථ 02ක වටිනාකම රු.2,791,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.797,153 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාව විසින් විදුලිබල මණ්ඩලයේ තැන්පත් කර තිබුණු රු.16,500 ක් වූ ආරක්ෂිත ඇප තැන්පතු මුදල මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම

----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.108,530,673 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.4,457,519 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

---------------------

ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.4,392 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

හිඟ හිටි වෙනත් ආදායම් ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.1,180,115 ක ශේෂ 161 ක්ද, වසර 03 ක කාලයක් ඉක්මවා තිබුණු රු.934,087 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ 356 ක්ද, ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතු කළ අගය මත බදු රු.624,939 ක් ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.51,014,571 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීනව හා විධිමත්ව පවත්වන ලද ස්ථාවර වත්කම් ලේඛනයද, රු.5,044,324 ක් වූ ප්‍රාග්ධන ආධාර, රු.9,283,339 ක් වූ මුද්දර ගාස්තු හා උසාවි දඩ, සම්බන්ධව ලේඛනද, එකතු වටිනාකම රු.3,522,816 ක් වූ විවිධ ණයහිමි ශේෂ හා ගෙවිය යුතු තැන්පතු පිළිබඳ උපලේඛනද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

------------------------------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 ප්‍රකාර අයවැයගත හා පරිපූරක සම්මත වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසදා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,205,712 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,897,611 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.691,899 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ මුළු පුනරාවර්තන ආදායම ආදායම් ආධාර ස්වයං උත්පාදන ආදායම් සහ මුළු පුනරාවර්තන වියදම පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදන ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 42,234,116 | 24,757,178 | 17,476,938 | 36,028,404 | (18,551,466) |
| 2014 | 35,977,675 | 17,830,084 | 18,147,591 | 29,080,064 | (10,932,473) |
| 2013 | 28,183,807 | 10,716,194 | 17,467,613 | 22,713,680 | (5,246,067) |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සෑම වර්ෂයකම ආදායම් ආධාරවල වර්ධනයක් සහ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායම්වල රු.670,653 ක අඩුවීමක්ද, පෙන්නුම් කෙරුණි.

(ii) සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වර්ධනය වී ඇති නමුත්, එම තත්ත්වය කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) සභාවට ආදායම් ආධාර නොලැබෙන්නට කිසිදු ආකාරයකින් සභාවේ ස්වයං උත්පාදන ආදායම්වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පවතින බව පෙන්නුම් කෙරේ.

## 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1 අක්කර බදු

-----------

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු ශේෂය රු.229,640 ක් වූ අතර, වර්ෂයේ අයකිරීම් ආරම්භක ශේෂයෙන් සියයට 5 ක් හා බිල් කිරීම් වලින් සියයට 25 ක් විය. කෙසේ වුවද, හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.2 වෙළඳ බලපත්‍ර**

---------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.70,522 ක හිඟ ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අය කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**2.3.3 කුලී**

-----

එකතුව රු.1,438,414 ක් වූ ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 26 ක් පමණක් අයකර තිබීම නිසා වර්ෂය අවසානයට හිඟ කුලී ශේෂය රු.1,427,373 ක් වූ ඉහළ අගයක් ගෙන තිබුණි.

**2.3.4 ජල ගාස්තු**

-----------

ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 39 ක් සහ බිල්කිරීම් වලින් සියයට 61 ක් පමණක් අයකර තිබීම හේතුවෙන් වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.1,056,232 ක් වූ ඉහළ අගයක් ගෙන තිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.694,307 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.8,589,033 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්ය සාධන ඇගයීම**

-------------------------

**ප්‍රාග්ධන වැඩ යෝජනා ඉටුකිරීමේ ප්‍රගතිය**

---

2015 වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම රු.148,260,000 ක් වූ නමුත්, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.2,745,089 ක් වූයෙන්, ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 2 ටත් වඩා අඩු මට්ටමක පැවතින.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

මානව සම්පත් කළමනාකරණය

---

සමාලෝචිත වර්ෂය අවසානයට කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 06 සම්පූර්ණ කර ගැනීමට සහ 15 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

**3.3.1 දේපළ ණය පොලී ප්‍රතිපූර්ණය**

---

සභාවේ නිලධාරීන්ට ලබාදෙන ලද දේපළ ණය සඳහා වූ බැංකු පොලියෙන් රු.237,135 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

**3.3.2 සේවක ණය**

---

සභාවේ නිලධාරීන් හා සේවකයින්ට ලබාදී තිබුණු එකතුව රු.133,800 ක් වූ ණය ශේෂවලට අදාළ ණය වාරික හා පොලී අයකිරීම වර්ෂයකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

**04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**4.1 අයවැය පාලනය**

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයෙහි ඇතුළත් වියදම් විෂයයන් 02 ක අයවැයගත වියදම් සීමාවන් ඉක්මවා රු.380,467 ක් ද වියදම් විෂයයන් 05 ක රු.1,224,101 ක ඉතිරිවීම්ද, ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.722,076 ක්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන සහ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. සභාව විසින් පත්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී රු.404,163 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටුව**

----------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------------

සභාවට අයත් පිරිවැය රු.32,449,752 ක් වූ වාහන 05 ක් සමාලෝචිත වර්ෂයේදී සභාවේ සංවර්ධන කටයුතු සඳහා හෝ ආදායම් උත්පාදන කටයුතු සඳහා ඵලදායී ලෙස යොදවාගෙන නොතිබුණි. එමෙන්ම පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් 2015 මාර්තු 06 දින ලැබී තිබුණු පිරිවැය රු.7,389,200 ක් වූ සිංගල් ඩ්‍රම් රෝලර් රථයද සමාලෝචිත වර්ෂයේදී ධාවනයට යොදවාගෙන නොතිබුණි.

(ආ) පවරා නොගත් වත්කම්

---------------------------

මෝටර් රථ 02 ක් හා රු.800,000 ක තක්සේරු වටිනාකමක් සහිත මහඕවිටකුඹුර නමැති ඉඩමද සභාව විසින් වර්ෂයකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගනිමින් පැවතුණු නමුත්, ඒවායේ අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාව අනුව වර්ග 07 කට අයත් ඉන්වෙන්ට්‍රි උපකරණ ඒකක 49 ක ඌනතාවයක් පැවති බව අනාවරණය වී තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) සේවක කළමනාකරණය
(ඊ) වත්කම් කළමනාකරණය